# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| මගේ අංකය எனது இல My Ref. | CSS/7/1/3 | ඔබේ අංකය உனது இல Your Ref. | | දිනය திகதி Date | 2020.11. 18 |
|---|---|---|---|---|---|


**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) – 11/2019 (ii)**

දකුණු පළාත් සභාවේ සියළුම
ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා
ගණන්දීමේ නිලධාරීන් වෙත,

**<u>ඇස්තමේන්තු සකස් කිරීමේ සීමාවන්, අනුමත කිරීමේ සීමාවන් හා ගිවිසුම්වලට එළඹීමේ සීමාවන් සංශෝධනය කිරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ඇස්තමේන්තු සකස් කිරීමේ සීමාවන්, අනුමත කිරීමේ සීමාවන් හා ගිවිසුම්වලට එළඹීමේ සීමාවන් සංශෝධනය කිරීම පිළිබඳව 2019.12.27 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 11/2019 හා 2020.03.05 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 11/2019(i) ට අතිරේක වශයෙනි.

දකුණු පළාත් සභාවට අයත් ආයතන වල ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේ සීමාවන්, නිර්දේශ කිරීම හා අනුමත කිරීමේ සීමාවන් හා ගිවිසුම්වලට එළඹීමේ සීමාවන් සංශෝධනය සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර 2019.11.30 දින ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ පැවැත්වූ සාකච්ඡාව අනුව ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/2/1/1/2019 හා 2019.12.27 දිනැති ලිපියෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගෙන 2019.12.27 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 11/2019 නිකුත් කරන ලද අතර ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/2/1/1/දීමනා හා 2020.02.27 දිනැති ලිපියෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගෙන 2019.12.27 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 11/2019 (i) නිකුත් කරන ලදි.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

එම ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 11/2019 චක්‍රලේඛයෙහි 3.2 ඉංජිනේරුවන්ගේ ඇස්තමේන්තු අනුමත කිරීමේ හා ගිවිසුම් වලට එළඹීමේ බලතල යටතේ ඇති වගුවෙහි අංක 7 යටතේ, ඇස්තමේන්තු මුල්‍ය සීමාව රු.ලක්ෂ 10ට වැඩි - ලක්ෂ 20 ට අඩු ඇස්තමේන්තු නිර්දේශ කිරීමේ බලය III ශ්‍රේණි වල තාක්ෂණ නිලධාරීන්ටද ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදුව, පහත ආකාරයට එම වගන්තිය සංශෝධනය කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2020.11.11 දින ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/2/1/1/දීමනා හා 2020.11.13 දිනැති ලිපියෙන් දන්වා එවා ඇති බව කාරුණිකව දන්වමි. (එම ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා එවමි.)

3.2 <u>ඉංජිනේරුවන්ගේ ඇස්තමේන්තු අනුමත කිරීමේ හා ගිවිසුම් වලට එළඹීමේ බලතල.</u>

| අනු අංක | ඇස්තමේන්තු මුල්‍ය සීමාව (රු) | ඇස්තමේන්තු සකස් කිරීම | නිර්දේශ කිරීම |
|---|---|---|---|
| 7. | ලක්ෂ 10ට වැඩි - ලක්ෂ 20ට අඩු | ශ්‍රී.ලං.තා.සේ. පුහුණු/ III/II/I | II/I ශ්‍රේණිය/පන්තියේ තාක්ෂණ නිලධාරීන්<br><br>** II/I ශ්‍රේණි වල තාක්ෂණ නිලධාරීන් නොමැති පළාත් පාලන ආයතන වල III ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨතම තාක්ෂණ නිලධාරීන්ට හැකිය. |

ආර්.සී.ද සොයිසා,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් - 01. ආණ්ඩුකාර ලේකම්,ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,දකුණු පළාත - දැ.ගැ.ස
02. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/මුදල්/පිරිස් හා පුහුණු) - දැ.ගැ.ස
03. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) - දැ.ගැ.ස
04. සහකාර ප්‍රධාන ලේකම් (පාලන/ආයතන/පිරිස් හා පුහුණු) - දැ.ගැ.ස
05. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත - දැ.ගැ.ස
06. ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ, ප්‍රධාන ලේකම් කාර්යාලය - දැ.ගැ.ස
07. අයවැය අධ්‍යක්ෂ, ප්‍රධාන ලේකම් කාර්යාලය - දැ.ගැ.ස

"ජනතා හිතවාදී හා ඵලදායී රාජ්‍ය සේවයක් උදෙසා"

(02)

# ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දකුණු පළාත

ஆளுநர் செயலகம் - தென் மாகாணம்

Governor's Secretariat - Southern Province

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Number: G/SP/1/2/1/1/දීමනා | ඔබේ අංකය / உமது இல. / Your Number: | දිනය / திகதி / Date: 2020/11/13 |

රුහුණ
16 NOV 2020
ප්‍රධාන ලේකම් දකුණු පළාත.
D/F

ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

**ඇස්තමේන්තු සකස් කිරීමේ සීමාවන්, අනුමත කිරීමේ සීමාවන් හා ගිවිසුම්වලට එළඹීමේ සීමාවන් සංශෝධනය කිරීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතූ ඔබගේ අංක CSS/7/3/7 හා 2020.09.21 ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි නිකුත් කරන ලද අංක 11/2019 (මුදල්) ප්‍රධාන ලේකම් චක්‍රලේඛයෙහි 3.2 ඉංජිනේරුවන්ගේ ඇස්තමේන්තු අනුමත කිරීමේ හා ගිවිසුම් වලට එළඹීමේ බලතල යටතේ ඇති වගුවෙහි අංක 7 කොටස පහත දක්වා ඇති පරිදි සංශෝධනය කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2020.11.11 වන දින ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.

| අනු අංකය | ඇස්තමේන්තු මූල්‍ය සීමාව(රු) | ඇස්තමේන්තු සකස් කිරීම | නිර්දේශ කිරීම |
|---|---|---|---|
| 7. | ලක්ෂ 10 ට වැඩි- ලක්ෂ 20 ට අඩු | ශ්‍රී.ල.තා.සේ. පුහුණු/ III/II/I | II/I ශ්‍රේණිය/පන්තියේ තාක්ෂණ නිලධාරීන්<br><br>** II/I ශ්‍රේණි වල තාක්ෂණ නිලධාරීන් නොමැති පළාත් පාලන ආයතන වල III ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨතම තාක්ෂණ නිලධාරීන්ට හැකිය |

**සී.වික්‍රමසිංහ**
**ආණ්ඩුකාර සහකාර ලේකම්**
**ආණ්ඩුකාර ලේකම් වෙනුවට**
**දකුණු පළාත**

සී.වික්‍රමසිංහ
ආණ්ඩුකාර සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

7/3

ලිපිනය: පහළ ඩික්සන් පාර, ගාල්ල.
දුරකතන : 091-2234480
ෆැක්ස්: 091-2229811
ඊ-මේල්: governsecspc@sltnet.lk
වෙබ් අඩවිය: governor.sp.gov.lk

முகவரி: கீழ் டிக்சன் வீதி, காலி.
தொலைபேசி: 091-2234480
தொலைநகல்: 091-2229811
மின்-அஞ்சல்: governsecspc@sltnet.lk
இணையதளம்: governor.sp.gov.lk

Address : Lower Dikson Road, Galle.
Telephone : 091-2234480
Fax: 091-2229811
e-mail: governsecspc@sltnet.lk
Website: governor.sp.gov.lk